# දිය යට පුරාවිද්‍යා උරුම කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තීන් හා ශ්‍රී ලංකාවේ නෛතික තත්ත්වයන්

[1]ඩබ්. එච්. නදීකා කුමාරි

මුහුදු පුරාවිද්‍යා ඒකකය, ගාල්ල
whnadeekakumari@gmail.com

1

## හැඳින්වීම

උරුම කළමනාකරණය යන විෂයය මෑත කාලයේදී ජාත්‍යන්තරව මෙන්ම ජාතික වශයෙන් ද මහත් අවධානයක් දිනා ගත් විෂයය ක්ෂේත්‍රයකි. මුල් කාලයේදී එහි ප්‍රධාන විෂයය වූයේ ගොඩබිම පිහිටි ස්වභාවික හා මානව නිර්මිත උරුමයන් ආරක්ෂා කිරීම පිළිබිද අවධානය යි. දියයට පුරාවිද්‍යා විෂයය ක්ෂේත්‍රය පුලුල්වත්ම "දිය යට උරුම කළමනාකරණය (Underwater Cultural Heritage Management- UCHM)" පිළිබිද පුළුල් ලෙස සාකච්ඡාවට බිදුන් විය. උරුම කළමනාකරණය යන විෂයය ඒකල විෂයයක් ලෙස පැවති වකවානුවේ ඊට අදාළ ව සකස් කෙරුණු ප්‍රඥප්තීන් හා අණ පනත් වෙනසක් නොමැතිව දිය යට උරුම ආරක්ෂා කිරීම සිදහා යොදා ගත්ත ද එයින් අපේක්ෂිත සම්පූර්ණ ආවරණය සිදු නොවීම මත දිය යට උරුමයන් කළමනාකරණය සඳහාම සුවිශේෂ වූ ජාත්‍යන්තර හා ජාතික අණ පනත් නිර්මාණය වීම ආරම්භ විය.

## අන්තර්ගතය

දියයට උරුමයන් ආරක්ෂාකර ගැනීම සිදහා ගන්නා ලද ක්‍රියාමාර්ග අතර ඉතාම ආසන්නතම අවස්ථාව නම් දිය යට උරුම කළමනාකාරීත්වය සිදහා වන 2001 ප්‍රඥප්තියයි (UNESCO 2001 Convention on UCHM). මෙය එක්සත් ජාතීන්ගේ සංවිධානය යටතේ ඇති අධ්‍යාපනික, විද්‍යාත්මක, හා සංස්කෘතික සංවිධානය විසින්, 2001 නොවැම්බර් මස පැරීසියේදී පවත්වන ලද ප්‍රධාන සම්මේලනයේදී සම්මත කර ගන්නා ලද ජාත්‍යයන්තර මාර්ගෝපදේශන සහිත උපදෙස් මාලාවකි. මෙහි එක්සත් ජාතීන්ගේ සංවිධානය යටතේ ඇති සියලුම රටවල දිය යට උරුමයන් කළමනාකරණය කර ගැනීම සිදහා අවශ්‍යය වන උපදෙස් මාලාව සවිස්තරව ඉදිරිපත් කොට තිබේ. මේ සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩමුළු හා වැඩ සටහන් ශ්‍රී ලංකාව ද ඇතුළුව බොහෝ රටවල පවත්වා ඇත. ඉන් රටවල් හතලිස් එකක ප්‍රමාණයක් මේ වන විට ප්‍රඥප්තියට අත්සන් තබා එකිගත්වය පල කර ඇතත් අනෙක් රටවල් ප්‍රඥප්තියේ ඇති කරුණු පිලිබිද තවදුරටත් අධ්‍යයනය කරමින් පවතී. ඒ රටවල් අතරට ශ්‍රී ලංකාව ද අයත් වේ.

2001 ප්‍රඥප්තියේ දිය යට උරුමයන් විග්‍රහ කර ඇත්තේ මෙසේය. "මානවයාගේ මැදිහත්වීමෙන් නිර්මාණය කරන ලද දිය යට තැන්පත්ව ඇති සංස්කතික, ඓතිහාසික, පුරාවිද්‍යාත්මක වැදගත්කමක් ඇති වසර 100 කට වඩා පැරණි වස්තූන් සියල්ල මීට අයත් වේ" යනුවෙනි.

දිය යට උරුම ලෙසින් වැඩි දුරටත් විස්තර දක්වමින් ජලාශ්‍රිත පුරාවිද්‍යාත්මක ස්ථාන, යම් ඉදිකිරීමක්, ගොඩනැගිල්ලක්, පුරාවස්තු, මානව අවශේෂයන් එහි පුරාවිද්‍යාත්මක හා පාරිසරික සබිදතාව හා ජල යාත්‍රා, ගුවන් යානා, වෙළිද ගනුදෙනුවලට සම්බන්ධ වෙනත් වාහන පුරාවිද්‍යාත්මක මෙන්ම පාරිසරික සබිදතාවක් සහිත ස්ථාන වැනි දෑ සේම ජලාශ්‍රිතව ප්‍රාග් ඓතිහාසික වටිනාකමක් සහිත දේ හා ස්ථාන අයත් වේ.

මෙම ලේඛනය වගන්ති 35 ක් සහ නියමයන් 36 කින් ද යුක්ත සවිස්තර ගිවිසුමකි. එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් මීට ප්‍රථම සාගරයේ පරිපාලනය සම්බන්ධව ඉදිරිපත් කරන ලද "මහ මුහුදේ නීතිය" (United Nations convention on the law of the sea -UNCLOS) නම් වූ ලේඛනයේ වගන්තිවලට අනුකූලව සකසා ඇත. අද ලෝකයේ මහා සාගරය සම්බන්ධ සියලුම තීරණ ගනු ලබන්නේ මෙම ලේඛනයේ අන්තර්ගත මග පෙන්වීම්වලට අනුව ය. දිය යට උරුම කළමනාකරණය පිළිබිඳ 2001 ප්‍රඥප්තියට පෙර ඒ සිදහා ගුරු කොට ගනු ලැබූ ලේඛන කිහිපයක් අවධාරණය කළ හැකිය. 1954 සම්මත කර ගන්නා ලද සුප්‍රසිද්ධ හේග් ප්‍රඥප්තිය යටතේ යුධ ගැටුම් අවස්ථාවලදී උරුමයන් ආරක්ෂා කර ගැනීම සිදහා වන උපදෙස් අන්තර්ගත වේ. 1970 දී සම්මත කර ගන්නා ලද ප්‍රඥප්තිය මගින් සංස්කෘතික දේපල ආනයනය අපනයනය ඍ අන්සතු කිරීම වැනි කරුණු පිළිබිඳ අවශ්‍යය මග පෙන්වීම ඉදිරිපත් කොට ඇත. මේ යටතේ එක් රටකට අයත් සංස්කෘතික දේපල අනවසරයෙන් ගෙන යාම හෝ ලබා දීම තහනම් වේ. 1972 දී දිය යට ඇති උරුමයන් ආරක්ෂා කිරීම පිළිබිදවම අරමුණු කර ගනිමින් ම සකස් කරන ලද ප්‍රඥප්තියක් වේ. පෙර සිදහන් කරන ලද "මහ මුහුදේ නීතිය " 1982 දී එක්සත් ජාතීන් විසින් සම්මත කර ගන්නා ලදී. අයිකොමස් ආයතනය විසින් සම්මත කර ගන්නා ලද දිය යට උරුමයන් ආරක්ෂාව පිළිබිදව වන ප්‍රඥප්තිය විශේෂ වේ. දිය යට උරුම කළමනාකරණය පිළිබිඳ 2001 ප්‍රඥප්තිය ඉහත සිදහන් සියලුම ප්‍රඥප්තීන් හා රෙගුලාසීන් අධ්‍යයනය කොට සියලුම අංශයන් ආවරණය වන පරිදි සකස් කරන ලද්දකි.

දිය යට උරුම කළමනාකරණය පිළිබිඳ ප්‍රඥප්තීන් හා අණ පනත් මෙසේ ජාත්‍යයන්තරව සකස් වෙද්දී දේශීයව ඊට සමගාමීව අණ පනත් හා සංශෝධන කිහිපයක් ඇති වූ ආකාරය හිදුනා ගත හැකිය. එයින් ප්‍රධානම ලේඛනය වන්නේ 1940 අංක 09 දරණ පුරාවිද්‍යා ආඥා පනතයි. එහි පුරාවස්තුවල අයිතිය පිළිබිදව සිදහන් වන අංක 03 යටතේ ඉතා පුිරල් විග්‍රහයක් සිදු කොට තිබේ."භූතලය මතුපිට හෝ ඉන් යටත හෝ යම් ගංගවක හෝ විලක හෝ සැඟවී තිබෙන (පැරණි ස්මාරක හැර) සොයා ගෙන නොමැති සියලු පුරාවස්තු මේ ආඥා පනතේ විධි විධානවලට යටත්ව සම්පූර්ණයෙන් ම රජයේ දේපලක් ලෙස සලකනු ලැබිය යුතුය." වශයෙන් සියලු පැතිකඩයන් ආවරණය වන පරිදි විවරණය කර ඇත. ඊට සංශෝධන හැටියට ඉදිරිපත් කරන ලද 1998 අංක 24 දරන පුරාවස්තු පනත මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියේ 3 වන උප වගන්තියෙහි "හෝ විලක" යන වචන වෙනුවට "හෝ විලක" හෝ ශ්‍රී ලංකාවේ දේශීය සමුද්‍රය ඇතුළත හෝ " යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය සංශෝධනය කර ඇත.

මෙම පුරාවිද්‍යා අණ පනත්වලට අතිරේකව දිය යට ඇති උරුමයන් ආරක්ෂා කිරීම සම්බන්ධව සහාය වන වෙනත් අණ පනත් හා නියමයන් පවතී. ප්‍රධාන වශයෙන් සංස්කෘතික දේපළ පනත, වෙරළ සංරක්ෂණ ආඥා පනත, ජාතික ජලජ සම්පත් සංරක්ෂණ ආඥා පනත සහ වෙළඳ නාවික ආඥා පනත් මින් කිහිපයකි.

**නිගමනය**

ඉහත විග්‍රහයන්ට අනුව ජාතික හා ජාත්‍යන්තරික ප්‍රඥප්තීන් මිගින් මුහුදේ හෝ ගොඩබිම හෝ ජලයෙන් යට ව ඇති වසර 100 කට වඩා පැරණි නාවික යාත්‍රා හෝ වරාය න්, ජනාවාස, හෝ කිසියම් ඉදිකිරීමක් ඇත්නම් ඒ සියල්ල ආරක්ෂක ස්මාරක හැටියට විශේෂයෙන් ගැසට් මගින් ප්‍රකාශයට පත් නොකළා වුව ද නෛතික ආරක්ෂාවක් මෙමගින් සැපයේ. ප්‍රායෝගිකව පැන නගින ගැටලුව නම් ඇතැම් විශේෂ නාවිකයාත්‍රා ආරක්ෂා කිරීම වැදගත් වුව ද වසර 100 ක සීමාව ගැටලුවක් බවට පත්වේ. එවැනි අවස්ථාවලදී එම යාත්‍රා නිෂ්පාදනය කළ වර්ෂය සැළකිල්ලට ගනු ලැබේ.දියයට උරුමයන් කළමණාකරණය සඳහා මෙරටගෙන ඇති නෛතිකරාමුන් වැදගත් සේම ඒ සඳහා වන ජාත්‍යන්තරික ප්‍රඥප්තීන් ද මහගු පිටුවහලක් සපයයි.

**ආශ්‍රෙය ග්‍රන්ථ**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ1940 අංක 09දරන පුරාවස්තු ආඥා පනත

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1998 අංක 24 දරන පුරාවස්තු ආඥා සංශෝධන පනත

Prott, L, V; 2006, Finishing the Interrupted Voyage, Papers of the UNESCO Asia-Pacific Workshop on the 2001 Convention on the Protection of the Underwater Cultural Heritage,

http://www.unesco.org/new/en/culture/themes/underwater-cultural-heritage/2001-convention/